බාලවයස්කාර දැරියක් ලිංගික අපයෝජනයට යොදාගත් බවට වන පුවතක්, දිවයින ඉරිදා සංග්‍රහය (12/26), සති අග අරුණ (12/26) සහ මව්බිම (12/23) පුවත්පත් තුළ දක්නට ලැබිණි. එම පුවත් වාර්තා පිළිබඳව අපගේ නිරීක්ෂණයන් මෙසේයි.

සැකකාරියගේ වාර්ගිකත්වය සඳහන් කර ඇති පුවත්පත්: දිවයින ඉරිදා සංග්‍රහය, මව්බිම

සැකකාරිය 'රූමත්' යනුවෙන් සඳහන් කර ඇති පුවත්පත්: සති අග අරුණ

දිවි තොර කරගැනීමේ උත්සාහයක් පිළිබඳව සඳහන් කරන නමුත්, උපකාරක අංක සඳහන් කර නැති පුවත්පත්: සති අග අරුණ

ඒ අනුව,
1) මෙම පුවත් වාර්තාවන් තුළ අදාළ වාර්ගිකත්වය සෘණාත්මක සන්දර්භයක් තුළ ඉස්මතු කොට දැක්වීම පුවතට අදාළ වන්නේ ද?

2) පුවත් වාර්තාවන් දෙකක් තුළ අදාළ සැකකාරියගේ නමද සඳහන්ව තිබියදී, නැවත ඇයගේ වාර්ගිකත්වය ද 'මුස්ලිම්' යැයි සඳහන් වී ඇත්තේ මන්ද?

3) එසේ නම්, පුවතට අදාළ නොවන තැනක වාර්ගිකත්වයන් සෘණාත්මකව ඉස්මතු කිරීම ඔස්සේ, යම් කිසි වාර්ගිකත්වයක් සෘණාත්මකව ඒකාකෘතික (stereotype) වන්නේ යැයි ඔබ නොසිතන්නේ ද?

4) "රූමත්" වැනි විශේෂණ ඔස්සේ කාන්තාවක ලිංගික වස්තුවක් ලෙසින් හැඟවුම්කරණය කිරීම, ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම්ව සිදුවන කොන් කිරීමක් නොවන්නේ ද?

5) දිවි තොර කරගැනීමේ ප්‍රයත්නයක් පිළිබඳව සඳහන් කර ඇති නම්, හදිසි උපකාරක අංකද එම වාර්තාව හා සඳහන් කළ යුතු නොවන්නේ ද? එයින් දිවි තොර කරගැනීමේ නැඹුරුතාවක් ඇති තවත් ජීවිතයක් බේරා ගැනීමට ඉඩක් ලැබෙන්නේ නොවේද?